Page 10 December 2011.qxd 23/12/2011 23:56 Page 1



## ඇත්ත කෙටි කතාව රැකෝර්ඩ් බාර් අත්දැකීම් / ටැක්සි ගමන

**මේ** රෙකෝඩ් බාර් කාලෙ අන්තිම කතාව.

දවසක් මම දෙමටගොඩ හෝම්කමිං එකකට ශබ්ද විකාශන යන්ත්‍ර සපයලා රෑ දොළහට විතර ගෙදර එන්න පටන්ගත්තා. ඒ කාලෙ හෝම් කමිං වල සිරිත තමයි මුළු ගමටම ඇහෙන්න සද්දෙ දාන එක. ඉවරවෙන වෙලාවකුත් නැහැ. රෑ දහයයි කියලා බුක් කළාට දොළහ එක වෙන කල් යනවා. ඇම්ප්ලිපයර් ගල වන්න දෙන්නෙ නැහැ. “අනේ තව ටිකක් ඉන්න, මේ අපේ මාමට සිංදුවක් කියන්න ඕනලු.” එක සිංදුවෙන් වැඩේ නවත්තන පාටකුත් නැහැ. ලස්සන වැඩේ තමයි, ඇට් හෝම් ගෙදර ඇවිත් වෙරි වෙච්ච ඒ මාමලා හැමෝටම සිංදු කියන්න ඕන. කොහොම හරි මේ කියන දවසෙ මම රෑ දොළහට විතර පැනගත්තා.

බඩුමුට්ටු ටික සාප්පුවට දාලා අන්තිම බස්එක අල්ල ගෙන යන්තම් බොරැල්ලට ඇවිල්ලා, එතන ඉඳන් රාජගිරියට පයින් ආවා. පාන් කියන්න බැරිතරම් මහන්සියි. මාදින්නාගොඩ ගෙදරට තව පැය බාගෙක විතර ගමනක් තියනවා. තව එක අඩියක්වත් ඉස්සරහට යන්න පණක් නැහැ. ඒ කාලෙ ත්‍රීවීලර් තිබුණෙ නැහැ. තිබුණෙ මොරිස් මයිනර්, පොක්ස්-වැගන් කලු ටැක්සි. ඒ හැම එකේම මීටර් තිබුණා. ඒත් රෑට යන ගමනට ගණනක් කතා වෙනවා. ගෙදරට යන්න එතන ඉඳලා කුලිය රුපියල් පහයි. කමක් නෑ. හැමදාම කරන්නෙ නැනේ. හෝම්කමිං එකෙන් ලැබුණු රුපියල් පණහත් අතේ තියනව නේ.

රාජගිරියෙ බෝගහ හන්දියෙ ඉඳලා වැලිකඩ බෝගහ ළඟට යාර ගණනයි. එතන තමයි ටැක්සි ගාල තියෙන්නෙ. (දැන් නම් රාජගිරියෙ ඒ බෝගහ කපලා දාලා එතන පාර ලොකු කරලා.) ටැක්සියකට කතාකරලා දොර ඇරලා ඉඳගත්තා ගෙදර යන්න. අම්මෝ හරියට දිව්‍යලෝකෙ ගියා වගේ හරි සනීපයි.

ටැක්සියෙන් ගේ ළඟට ඇවිත් බැහැලැ, මම ගේට්ටුව ඇරගෙන දොර ළඟට ගිහිල්ලා, සාක්කුවට අත දැම්මා යතුර ගන්න, දොර අරින්න. බොලේ ! යතුරු කැරැල්ල ටැක්සියෙ වැටිලා. සාප්පුවෙ යතුරුත් එතන. මම එවලෙම හැරිලා මහ හඬින් කෑ ගැහුවා, “ ටැක්සි ටැක්සි ” කියලා. ටැක්සිකාරයා මගේ දිහා බලන්නෙවත් නැතුව හැටට පාගලා යනවා. මම “ටැක්සි... ටැක්සි...” කිය කිය කෑගගහා පස්සෙන් දිව්වා. ටැක්සිය ටික වෙලාවකින් මගේ දර්ශන පථයෙන් අතුරු දහන් වුණා. කට්ට කරුවලේ මම ආපහු වැලිකඩ හන්දියට ම දිව්වා. ඒ කාලෙ පාරෙ ලයිට් නැහැ.

හන්දියට ගිහිං බැලුවම එතන මම ගත්තු ටැක්සිය නැහැ. තව ටැක්සි දෙක තුනක් නවත්තලා තිබුණා. මම එනව දැකලා එක ඩ්‍රයිවර් කෙනෙක් බැහැලා ඇවිල්ලා ඇහුවා, “මහත්තෙයා දැන් ගුණදාසගෙ ටැක්සියෙ ගියා නේද? ” කියලා. මම එයාට වෙච්ච අකරතැබ්බෙ කිව්වා. මගේ යතුරු කැරැල්ල ගැනයි, අපේ ගේ තියන තැනයි, නම ගම කිව්වම, බැලින්නම් ඒ මනුස්සයා අපේ වතගොත දන්න කෙනෙක්. ගුණදාස ආවම ඉක්මනට යතුරු කැරැල්ල ආපහු එවන්නම් කිව්වා. මම ස්තුති කරලා හැරෙන කොට මිනිහා අහපි “ මහත්තෙයා මම එන්නද බස්සලා එන්න? ” කියලා. “එපා..... එපා..... මම පයින් යන්නම්.....” කියලා මම ආවා.



රාජගිරියෙ ටැක්සි ගුණදාසගෙ කලු මොරිස් මයිනර් ටැක්සිය

අපෝ තව රුපියල් පහක් කොහෙන් දෙන්නද?

ගාට ගාට විනාඩි හතළිස් පහක් විතර ඇවිදලා ගෙදරට සේන්දු වුණා. දොරට ගහලා අම්මට කියලා දොර අරව ගත්තා. කතාවක් නැතුව එහෙම්ම ගිහිං ඇඳට වැටුණා.

පහුවදා වැලිකඩ හන්දියට ගියත් ටැක්සි ගුණදාස හම්බ වුණේ නෑ. මගේ සහායකයා චන්ද්‍රා එයාට මම දීලා තිබුණු යතුරෙන් සාප්පුව ඇරලා තිබුණා. හවස ගෙදර එන ගමන් බැලුවා, ඒත් ගුණදාස නැහැ. ගෙදර යනකොට මගේ ලොකු අම්මගෙ පුතා, නීල්ට යතුරු කැරැල්ල ගෙනැත් දීලා තිබුණා. අපේ ගේ ළඟමයි ඉන්නෙ. ටැක්සි ගුණදාස එයා අඳුරනවා. පස්සෙ තමයි නීල් අයියගෙන් ටැක්සිකාරයගෙ කතාව දැන ගත්තෙ. මාව බස්සලා ටැක්සි කාරයා හැරෙන කොටම මම ටැක්සි ටැක්සි කියලා කෑගැහුව ම මෑන් හිතලා තියෙන්නෙ මංකොල්ල කාරයෙක් නවත් තන්න හැදුවයි කියලා. ගුණදාස මෙහෙම කිව්වලු. “ මහත්තෙයා මම අර මහත්තෙයා බස්සලා හැරෙන කොටම කවුද යටි ගිරියෙන් කෑගහගෙන පැන්නා ටැක්සි ටැක්සි කියලා .....මම බය වෙච්ච පාර මහත්තෙයො ලැල්ලට තියලා පැගුවා......”

එදා මම ටැක්සියෙන් ගෙදර ගියා. ඒ පාර ආපහු ඒ දුරම දෙපාරක් පයින් ගියා.

අදත් මම මෙහේදි වුනත් හදිසියකට ටැක්සියකින් ගියොත් බැස්ස ගමන් සාක්කු අතගාලා බලනවා, ගෙදර යතුරු කැරැල්ල තියනවද කියලා.

**♦ නීතිඥ අනුර හෑගොඩ**





## අධිවේගී මාර්ගය සහ ලෙල්ලට පෑගීම

**ලෝ**කෙ සියළුම රටවල පාහේ වේගෙන් යාහැකි හෙවත් අධිවේගී මාර්ග තියෙනවා. අපේ රට ශ්‍රීලංකාවටද පිටරට විදියට අධිවේගී මාර්ගයක් අවශ්‍ය කියලා බොහෝ කාලයකට පෙර මත ප්‍රකාශ කරලා තිබුණා. ඒත් ඒක කවදාවත් නොකෙරෙන වැඩක් හැටියටයි බොහෝ දෙනා හිතුවෙ. ඒ මොකද තියන සාමාන්‍ය පාරක් වත් වළවල්, ගල්ගොඩවල්, හිල්, කුහර නැතුව කිසිදාක හදන්න බැරිවෙච්ච ලංකාව අධිවේගී පාරවල් හදන්නෙ කොහොමද කියලා හිතලයි. ඒ හිතපු හැටි නරක නැහැ. ඒ කොහොම වුනත් 2006 දී හදන්න පටන්ගත්තු කොළඹ ඉඳලා දකුණු පළාත කෙළවර දක්වා යන අධිවේගී පාර හරියට අවුරුදු 5 කින් හදලා ඉවරකරලා, විවෘතත් කළා දැනට සති දෙකකට ඉස්සර වෙලා. ඒක අපි කාටත් සංතෝෂයට කාරණයක්.

මේ අළුත් පාර ගැනත් ඒ පාරේ වාහන එළවන අය ගැනත් නොයෙක් මති මතාන්තර අදහස් පහුගිය ටිකේමත් දැනටත් ප්‍රකාශවෙනවා. විද්වතුන්ගෙන් මෙන්ම සාමාන්‍ය ජනතාවගෙනුත්. ඒ සියළු දේමත් ලංකාව කියන රට ගැනත් එහේ ජීවත්වන ජනතාව ගැනත් අපි හොඳට දන්න නිසාත් මේ අධිවේගී පාර ලංකාවට ප්‍රයෝජනයක් වේවිද ආපදාවක් වේවිද යන්න ගැන මට නම් තවම හරියට කියන්න බැහැ.

මහා බ්‍රිතාන්‍යයේ වාහන එළවන අය දන්නවා මෙහේ කොතරම් හොඳින් රියැදුරන් මාර්ග නීති පිළිපදිනවද කියලා. වාහනයක් පාරට දාන්න හන්දියක වැඩිවෙලා බලන් ඉන්න අවශ්‍ය නැහැ අනෙක් තැනැත්තා ඉක්මනට ඉඩ දෙනවා ඒ අනික් වාහනේට ඒ පාරට අවතීර්ණ වෙන්න. මෙහේ මෝටර් වේ කියලා හඳුන්වන අධිවේගී පාරවල්වල ඉතා පරෙස්සමෙන් එළවන්නෙ. කැමරා හයිකරලා තියන නිසා නීතියෙන් ඉඩදීලා තියන ප්‍රමාණයට වඩා යන්නෙ නෑ. දශම ගණනකින් හෝ වේගය වැඩිවෙලා අහුවුණොත් දඩ කොළයක් ගෙදරට තැපැලෙන් එනවා. ඒක ගෙවන්නම වෙනවා.

තව දෙයක් තමයි තරුණ මදයෙන් මත්වෙලා වාහනයට නැග්ග ගමන් පියාඹලා වගේ යන්න හදන අය මේ යුරෝපයේ ඇත්තෙම නෑ කියන්න පුළුවන්. ඒ වගේම අනෙක් වාහනේ එළවන තැනැත්තාට වඩා වේගයෙන් ඔහු අභිබවා රේස් යන්න මේ කිසිම තරුණයෙකුට උවමනා නෑ. පරෙස්සම් විය යුතු හැම තැනකම රියැදුරන් තරුණ වැඩිහිටි කියලා නෑ පරෙස්සම් වෙනවා. ඒ වගේම පාරෙ ගමන් ගන්නා මගීන් ගැන ඉතා විමසිලිමත් වෙනවා. ජනතාව පාර මාරුවෙන තැන්වලදී වාහනේ ඇන්පිම නිකමට වත් රේස් කරන්නෙවත් නැහැ ඒ මොකද මගීන් බයවේවි කියලා. ඔය ආදී වශයෙන් මාර්ගනීති පිළිපදින රියැදුරන් නිසා ඕනම අධිවේගී මාර්ගයක කරදරයක් නැතුව යන්න පුළුවන්. රිය පැදවීමට අවශ්‍ය යහපත් මානසික වාතාවරණයක් මේ හැමෝටම තියනවා.

ලංකාවෙ අපි හොඳින් දන්න දෙයක් තමයි එහේ ජනතාව බහුතරයක ඉවසීමක් නැතිකම. වාහනයක්ට නැග්ගම තැන නොතැන නොබලා අවශ්‍ය නැතත් තියන උපරිම වේගෙන් ඉගිලිලා යන්න. ඒ හැමෝටම හරි හදිස්සියක් තියෙන්නෙ. ඉස්සරහ යන වාහනේට හෝන් ගහලා කානුවට දාලා හරි ඒ වාහනේට ඉස්සර වෙන්න බලනවා. ඉඩ නොදුන්නොත් කුණුහරුපෙන් බනිනවා. රියැදුරන් ඉන්නෙ හැම තිස්සෙම කේන්තියෙන්. තව කෙනෙකුට වාහනයක් පාරට දාන්න ඉඩක් දෙන්නෙ නෑ.

තව දෙයක් තමයි ඒ වාහනේ තරුණ කාන්තාවක් හෝ තමන්ගෙ පෙම්වතිය වෙන්න ඉන්න කෙනා ඉන්නව නම් තරුණ හාදයො වාහනේ වේගෙන් එලවන්නෙ. වැඩ පෙන්නන්න.

ඔන්න ඔය කියන කාරණා නිසා තමයි ලංකාව වගේ රටකට අධිවේගී පාරවල් ආපදාවක් වෙන්න පුළුවන් කිව්වෙ. මේ අළුත් පාර විවෘත කරන්නත් ඉස්සර ඒ කියන්නෙ මේ අවුරුද්දෙ මුල ඉඳලා සැප්තැම්බර් අවසානය දක්වා රිය අනතුරු ලංකාවෙ **13, 625** ක් වෙලා තියනවා. එයින් බරපතල තුවාල ලත් අය **632** ක්. මියගිය සංඛ්‍යාව **680** ක්. මේ ගණන් හිලවු දකින කොට නොසැහෙන්න බයක් ඇතිවෙන්නෙ. අලුත් පාර නොවැම් බර් 27 වෙනිදා විවෘත කළත් අපේ ජනතාව තුළ අධිවේගී පාරට හුරු-වෙන මානසිකත්වය හැදෙන්න තව දශක කීයක් ගත වෙයි ද? ඒ කොහොම වුනත් මම සුබවාදීව හිතනවා අපේ ජනතාව ඉවසීම පුරුදු කරාවි කියලා. ලංකාව අවුරුදු **2319** ක බෞද්ධ රටක්. එච්චරකල් ගිහිල්ලත් බුදු දහමෙ මූලික හරය ඉවසීම ඒ රටේ අයට නැත්නම් මේ පාරක් හැදූ පමණින් ඒ ඉවසීම ඒවිද?

**♦ වෙලේගෙදර රාළ London**

## වඩිග පටුන නැටුම හගවන ලංකා ඉතිහාසයෙන් බිඳක්!





**ලං**කාවේ රජකම් කළ 1 වෙනි විජයබාහු (1055-1110) රජතුමාගේ ඔටුණු පැළඳවීමේ උත්සවයට ඉන්දියාවේ උසස්ම වංශය වූ බ්‍රාහ්මණ වංශයේ බ්‍රාහ්මණයින් පිරිසක් ඉන්දියාවේ සාලි ග්‍රාමම් නම් වූ පෙදෙසේ සිට ප්‍රථමවරට ලංකාවට ගෙන්වූ බැව් ලංකා ඉතිහාසයේ සඳහන් වෙයි. රජතුමා මේ කාර්‍යය භාරදී ඇත්තේ බේරුවල විසූ මුස්ලිම් ජාතික පෙරිය මුදලි මරික්කාර් නමැති තැනැත්තා ට ය.

ආදි කාලයේ දකුණු පළාතේ කළුතරට යාබද බේරුවල ප්‍රදේශයේ නැව් තොටුපලක් වූ අතර ඉන්දියාවේ සිට බ්‍රාහ්මණයින් ගෙන්වූ නැව බේරුවලට සම්ප්‍රාප්ත වූ බව කියති.

මෙම බ්‍රාහ්මණයින් හත් දෙනා සිංහළ රජ වාසලට ගෙන යනු ලැබුයේ මුස්ලිම් ජාතිකයින් පිරිසකගේ කරපිටින් බැව් ද ඉතිහා-සයේ සඳහන් වෙයි. මෙම සාලිග්‍රාම බ්‍රාහ්මණයින් රජවාසලට ගෙනයාමෙන් පසුව රජතුමා ඔටුණු පැළඳ වීමේ උත්සවය පැවැත්වූ බවත්, එම වංශවත් බ්‍රාහ්මණයින් උත්සවය සඳහා ලංකාවට ගෙන ඒම ගැන සතුටට පත් රජු එම පෙරිය මුදලි මරික්කාර්ට තෑගි බෝග දුන් බවත් කියැවේ.

ඔටුණු පැළඳවීමේ උත්සව යෙන් පසු බ්‍රාහ්මණයින් හත්දෙනා පෙරලා තම රටට යන්නට සූදානම් වූ අවස්ථාවේ රජතුමා ඔවුන් කෙරෙහි පැහැදී ඉතා සතුටින් ඔවුනට ලංකාවේ පදිංචිවීමට ආරාධනා කර ඇත. ඔවුන් එය පිළිගත් පසු ඔවුන්ට ගම්වර හා තෑගිබෝග දුන් බවත්, පසුව ඔවුන් ලංකාවේ කාන්තාවන් හා විවාහ වූ බවත් සඳහන්වේ.

සාලාග්‍රාම නම් ගමෙන් පැමිණ ලංකාවේ පදිංචි වූ ඔවුන්ගෙන් සලාගම කුලය බිහිවූ බව කියති. සලාගම බ්‍රාහ්මණ වංශයට අයත් සලාගම කොඩිය ලංකාවේ පැරණි කොඩි අතර වැදගත් තැනක් ගනී.

එම සලාගම කොඩිය කොළඹ කටුගෙයි සහ ගාල්ලේ කච්චේරියේ ද දක්නට ඇත.

එසේම ලංකාවේ දකුණු පළාතේ නොයෙකුත් උත්සව හා පෙරහැරවල ද, ශාන්ති කර්මවලද දක්නට ලැබෙන පහතරට නැටුම් සම්ප්‍රදායට අයත් වඩිගපටුන නම් නැටුම බ්‍රාහ්මණයින් ලංකාවට පැමිණීම සිහිකිරීමක් ලෙසද සැලකේ.

**♦ අමිතා හෙට්ටිගේ**
**Middx UK**

## ප්‍රශ්න වෙන කාට කියන්නද ඕයි?

**ගොවි** ගැටළු ගැන සංකච්ඡාකිරීමේ අරමුණෙන් ප්‍රබල ඇමතිවරයෙකුගේ සහභාගිත්වයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පැවති රැස්වීමකි. ඒ ප්‍රදේශයේ සෑම ගමක්ම නියෝජනය කරමින් එහි විශාල පිරිසක් රැස්වී සිටියහ.

මෙහි විශේෂත්වය වූයේ සෑම නියෝජිතයෙකුම වේදිකාවට පැමිණ තම ගැටලු ඉදිරිපත් කිරීමයි. සහභාගිවූ පිරිස වැඩි නිසා කාටත් අවස්ථාවක් දීම පිණිස එක් අයෙකුගේ කතාකිරීමේ කාලය සීමාකරන්නට සංවිධායකයින්ට සිදුවිය. කුරුවිට ප්‍රදේශයෙන් පැමිණ සිටි එක් නියෝජිතයෙකුට තම ගැටලු ඉදිරිපත් කිරීමේ වාරය පැමිණියේය. මයික් එක ඉදිරියට ආ ඔහු තම ගැටළුව ගැන විස්තර කරන්නට බොහෝ වේලාවක් ගත් බැවින් බැරිම තැන සංවිධායකයෙක් ඔහුගේ කනට කොඳුරා කතාව කෙටිකරන ලෙස කියා ඇත.

ඉන් කුපිත වූ ඔහු “ මට මේ කියන්න තියන දේවල් ඇමතිතුමාට නොකියා ගෙදර ගිහින් මගේ ගෑණිට කියන්නද ඕයි? ” කියා ලවුඩ්ස්පීකර් කටින්ම ඇසීය.

ඔහු අස්වැසූ ඇමතිවරයා “ කමක් නෑ කතාකරන්න” යයි ඔහුට දිගට කතාකරන්නට ඉඩ හැරියේය.

**♦ රූපිකා කේ බණ්ඩාර - කුරුවිට**